# වාර්ෂික ප්‍රගති වාර්තාව

# 2016

**සීමා නිර්ණය කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකාව**

## දැක්ම

සදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය ලබා ගැනිම.

## මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධින ලෙස , සදාචාරාත්මක ලෙස , සාධාරණ ලෙස , කාර්යක්ෂමව , පාරදෘෂ්‍යභාවයෙන් යුතුව විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරිම.

## අරමුණු

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම සමාන ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරිම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරිම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවිම.

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික සීමා නිර්ණය කොමිෂන් සභාවේ ප්‍රථම වර්ෂයේ ප්‍රගති වාර්තාව සංක්ෂිප්තව මෙලෙසින් ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවට කරන ලද 19 වැනි සංශෝධනය අනුව අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ හා 95 ( i ) ව්‍යවස්ථාවන්ට අනුකූලව ත්‍රිපුද්ගල සීමා නිර්ණය කොමිෂන් සභාවක් 2015 නොවැම්බර් 13 දින පත් කරන ලදි. සිය කාර්ය භාරය මැනවින් ඉටු කිරිමෙහි ලා කොමිෂන් සභාවට වගකීම පැවරෙන්නාවූද, පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය කෙරෙන්නා වූද මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරිමේ දී උපයෝගී කරගතයුතු මානයන් හඳුන්වා දෙන්නා වූද ඒ ව්‍යවස්ථාමය නියමයන් පාර්ලිමේන්තුව විසින් සම්මත කර දෙන තුරු කොමිෂන් සභාව අපේක්ෂාවෙන් සිටින්නීය. 2016 නොවැම්බර් මාසයේදී සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා ස්ථිර කාර්යාලයක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විවෘත කරන ලදී.

2016 දෙසැම්බර් අවසානය වන විට සීමා නිර්ණය කොමිෂන් සභාව සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද අර්ධ කාලීන ලේකම්වරයෙකුගෙන්ද , අර්ධ කාලීන ගණකාධිකාරිවරයෙකුගෙන්ද , සභාපතිවරයා සඳහා පූර්ණ කාලිනවූ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුගෙන් ද , රාජ්‍ය කළමණාකරණ සහකාර දෙදෙනෙකුගෙන් ද සමන්විත විය. කොමිෂන් සභාව සඳහා 2016 දෙසැම්බර් මැද සිට මෝටර් රථ දෙකක් ජනාධිපති කාර්යාලය මගින් සපයා දී තිබේ.

සීමා නිර්ණය කොමිෂන් සභාව ආරම්භයේ සිටම සීමා නිර්ණය පිළිබඳ ගෝලීය අත්දැකීම් ද , පූර්වගාමී සීමා නිර්ණය කොමිෂන් සභාවල ඉතිහාසය හා එම සභා බිහිවීමෙහිලා මූලසාධක වූ කරනු ආදි තොරතුරු ද සොයා බැලීමට ප්‍රයත්න දරන ලදි. මෙම ව්‍යායාමයේදී විවිධ වකවානුවල පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස, පළාත් පාලන ප්‍රදේශ හා පරිපාලන බල ප්‍රදේශ පිළිබඳ සීමා නිශ්චය කිරිමෙහි වගකීම යම් යම් ආයතන වලට පවරා තිබුණු බව දැන ගත හැකි විය.

ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා ආයතනවලට හා පරිපාලන ප්‍රදේශවලට අවශ්‍ය වන සීමා නිර්ණය ක්‍රියාවලිය සඳහා මැනවින් සංවිධානය වූ ස්ථාවර ආයතනයක් තිබිය යුතු බවද එය කාලීන ලෙස සමාලෝචනය කෙරෙන හා සංශෝධනය වන, මැනවින් ස්ථාපිත කරන ලද මූල ධර්ම සමුදායක් මත, බිහි විය යුත්තක් බවද ඒ සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්ගෙන් පැහැදිලි වී ඇත. රටේ ජන සංයුතිය නිරන්තරයෙන් වෙනස් වෙමින් පවත්නා හෙයින් සෑම ජන සංගණනයකට පසුව පළාත් පාලන ආයතන ( මහනගර සභා , නගර සභා හා ප්‍රදේශිය සභා ) අලුතින් ඇති කිරිම , ඒකාබද්ධ කිරිම , උත්ශ්‍රේණිගත කිරිම සිදු කල යුතුව ඇත. දැනට ද පළාත් පාලන ආයතන තත්වයන් උසස් කිරිම සඳහා වූ ඉල්ලීම් රාශියක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පෙළගැසී තිබේ. වර්තමානයේ පවත්නා ක්‍රමය නම් එවැනි ඉල්ලීම් එකක් හෝ කීපයක් අධ්‍යයනය කිරිමට රජය (අමාත්‍යවරයා) විසින් එක් සමාජිකයෙකු හෝ සමාජිකයන් කීපදෙනෙකු ගෙන් සමන්විත කමිටුවක් පත් කිරිමයි. එම ක්‍රමය

නිසා මෙම ක්‍රියාවලියේ ඒකීය භාවයක් හෝ එක සමාන බවක් දක්නට ලැබෙන්නේ නැත. එබඳු අවස්ථාවන් එක් ස්වාධීන සීමා නිර්ණය කොමිෂන් සභාවකට පැවරෙන්නේ නම් ඒකමතික වූද සමාන වූද මානයන් හා මූලධර්ම පද්ධතින් සහිත එක් රාමුවක් තුළ පවරන කටයුතු කිරීමට හැකිවේ.

මේ පසුබිම යටතේ ඡන්දයෙන් තෝරා පත් කෙරෙන පාර්ලිමේන්තුව , පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ සියලුම ආයතනවල ට ආදාළ සීමා නිර්ණය කටයුතු කිරීමේ නෛතික අධිකාරිය ලෙස එක් ස්වාධීන සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීම සුදුසු බවට රජයට මෙයින් යෝජනා කෙරේ. ඡන්දයෙන් තෝරා පත් කෙරෙන ආයතන සඳහා රාජ්‍ය සේවාවන් හැරුණු විට ( ගොවිජන සේවා , අධ්‍යාපන , සෞඛ්‍ය , අධිකරණ පොලිස් , රාජ්‍ය පරිපාලන ආදි ) පරිපාලන කටයුතු සඳහා ද ප්‍රදේශ නිර්ණය කිරීම හා වෙන් කිරීම කඩිනමින් අවධානය යොමු කළ යුතු කාරණයක් බව කොමිෂන් සභාව අවබෝධ කොටගෙන තිබේ. එම නිර්ණය කාර්යයන්ද මෙම ස්ථාපිත සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරයට ඇතුළත් කිරීම අවශ්‍ය වේ යයි මෙම සීමානිර්ණය කොමිෂන් සභාව යෝජනා කරයි.

කේ . තවලිංගම්

සභාපති

සීමා නිර්ණය කොමිෂන් සභාව

## 2. පසුබිම

වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ව්‍යවස්ථාවේ 41 ආ හා 95 ( 1 ) ව්‍යවස්ථා වලට අනුකූලවය. එය ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සභාපතිවරයා හිටපු සර්වේයර් ජනරාල් ආචාර්ය කේ. තවලිංගම් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක හා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ භූවිද්‍යා අංශයේ මහාචාර්ය එස්. එච් හස්බුල්ලා යන දෙදෙනා එහි සාමාජිකයෝ වෙති.

වර්තමාන ව්‍යවස්ථාව මගින් සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්ය භාරයක් පැනවී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ අණපනත් කිහිපයකින් හා කාර්ය පටිපාටි කිපයකින් ඡන්ද කොට්ඨාස හා පරිපාලන මට්ටම්වල විවිධ සීමා නිර්ණය කිරීම් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා දී තිබේ. රටේ උපරිම යහපත උදෙසා මෙම විධිවිධාන තර්කානුකූල ලෙස හැඩ ගැස්විය යුතුව තිබේ.

කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්විම් භාරගැනිමෙන් පසුව ඔවුහු එහි ප්‍රථම රැස්විමට 2015.11.19 දින කැඳවනු ලැබුහ. සියළුම සීමානිර්ණයන් එකම සීමා නිර්ණය කොමිෂන් සභාවක කාර්ය භාරයක් බවට පත් කිරීම නව පනතක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් මගින් සිදු කිරිමට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාව අපේක්ෂා කරන බවට මේ අවස්ථාවේදි අදහස් පල කරනු ලැබිණ.

2012 අංක 22 දරණ පනතින් පත් කරන ලද පළාත් පාලන ආයතන සීමා නිර්ණය සමාලෝචන කමිටුවේ කාර්ය භාරය හා ව්‍යවස්ථා සභාව නව සීමා නිර්ණය කොමිෂන් සභාවකින් අපේක්ෂා කරන පුළුල් කාර්යභාරයත් එහි අනාගත වගකීම් අතර අතිච්ජාදනයක් සිදුවන බැවින් ඒ පිළිබඳ නිරවුල් කර ගැනිම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත් , මැතිවරණ කොමිෂන් සභාවත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයත් එක්ව සාකච්ඡා සකස් කළ යුතු බවට මෙම රැස්වීමේදී එකඟතාවක් ඇති විය. එම රැස්විම 2016.11.23 දිනට නියම කර ගන්නා ලදි. ඉදිරියේ පැවැත්විමට අපේක්ෂිත පළාත් පාලන මැතිවරණ සඳහා අවශ්‍ය කටයුතු සීමා නිර්ණය සමාලෝචන කමිටුව විසින් නිම කළ යුතු බවද සීමා නිර්ණය කමිටුවේ කාර්ය භාරය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ යෝජිත වෙනස් කිරීම් ඇතොත් ඒවා ඉන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනස් කිරීම් මගින් සිදුකළ යුතු බවද එම රැස්වීමේදී තීරණය විය.

**2.1** **සීමා නිර්ණය කොමිෂන් සභාවේ පත්කිරීම් බලතල හා කාර්යයන් පිළිබඳ ව්‍යවස්ථාපිත විධිවිධාන**: 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත 41 ආ ව්‍යවස්ථාවට අනුව

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශයක් නොමැතිව එම ව්‍යවස්ථාවේ උපලේඛනයට අනුව නම්කර ඇති කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සමාජිකයෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු නොලැබිය යුත්තේය.

(2) ඒකී යම් කොමිෂන් සභාවක සභාපති හෝ සාමාජිකයෙකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටෙක එසේ පත් කරනු ලැබිය යුතු නිසි යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශ වලින් ලිංගික වර්ගීකරණය ඇතුළුව ශ්‍රී ලාංකිය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිඹිබු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් වශයෙන් පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර , නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතුය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුලත ජනාධිපතිවරයා විසින්, මෙම ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වූ විටෙක , එකී කාලපරිච්ඡේදය අවසන් වන දින සිට බල පැවැත්වෙන පරිදි

(අ) කොමිෂන් සාභාවක සමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාවක් යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තෙක් කොමිෂන් සභාවේ සමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය, සහ

(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු බවට (3) වන අනු ව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තෙකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සමාජිකයෙකුගේ වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවකදී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමැතිය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේය.

(6) මැතිවරණ කොමිෂන් සභාව හැර මේ අවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේය. පිළිතුරු දිමට බැඳී සිටිය යුත්තේය.

උප ලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව

(ඈ) විගණක සේවා කොමිෂන් සභාව

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභාව

(උ) මුදල් කොමිෂන් සභාව

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

95(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරිම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුලත , මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබියයුත්තේය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දේශපාලන කටයුතු වල නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනෙකුගෙන් එක් තැනැත්තෙක් එම කොමිෂන් සභාවේ සභාපතිධූරයට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් කිසි සමාජිකයෙකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස්වුව හොත් , එසේත් නැත්නම් යම් කිසි සාමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සමාජිකයෙකු වශයෙන් සිය කාර්තව්‍යය යථා පරිදි ඉටුකළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළ යුත්තේය.

96(1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට අඩු නොවූ ද විසි පහකට වැඩි නොවූද , මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාසය ට නමක් දිය යුත්තේය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සැලකිය හැක්කේය. නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේය.

(3) පළාතක් මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවකදී, හැකිතාක් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විත වන බවට වග බලාගනු පිණිස, සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් , එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේය.

(4) එක් පළාතක මැතිවරණ කොට්ඨාස වලට ( ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරාපත් කිරිමට හිමිකම ඇති මන්ත්‍රිවරයන් සංඛ්‍යාවට අමතරව) මන්ත්‍රිවරයන් සිව් දෙනෙකු තෝරාපත් කිරිමට හිමිකම ඇත්තේය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේය.

(5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සමාජිකයන් අතර මත භේදයක් ඇතිවුවහොත් ඒ සමාජිකයන් අතරෙන් වැඩි දෙනාගේ මතය බල පැවැත්විය යුතු අතර , එය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනාම එකකට එකක් වෙනස් මත දරන්නේ නම් , කොමිෂන් සභාවේ සභාපතිවරයා ගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයිනම් ඔහු එකඟ නොවිමට හේතු දැක්විය යුත්තේය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද , ඒ තීරණය ට එකඟ නොවන සමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය.

### 2.2 වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාපිත විධිවිධාන වල පවත්නා සීමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 වගන්ති දෙකෙහි කොමිෂන් සභාවල ප්‍රධාන කාර්යයන් සඳහන් වේ. එසේ වුවත් අනිකුත් කොමිෂන් සභාවල මෙන් නොව සීමා නිර්ණය කොමිෂන් සභාවේ,

- කාර්යභාරයන්
- බලතල

පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වල සඳහන් නොවේ.

සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.23 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හමු වූ අවස්ථාවේ දී මෙම කාරණය සඳහන් කළාය. මෙම කාරණයෙහිලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හෝ නව ව්‍යවස්ථාවක් අවශ්‍ය විය හැකි බැවින් ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කළ හැකි වන පරිදි ජාතික පළාත් හා ප්‍රාදේශිය වශයෙන් දේශපාලන නියෝජනයක් අවශ්‍ය වන සෑම මට්ටමකට ම අදාළ වන සීමා නිර්ණයට අදාළ මූලධර්ම පිළිබඳ මූලික අධ්‍යයනයක් සීමා නිර්ණය කොමිෂන් සභාව මගින් ආරම්භ කිරිමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමඟ එකඟ විණ.

## 3. සීමා නිර්ණය කොමිෂන් සභාවේ පරිපාලනය

### 3.1 සීමා නිර්ණය කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ ආරම්භක කටයුතු

සිය කාර්ය භාරය හා වගකීම් පිළිබඳව පැහැදිලි කිරිමක් කරන ලෙස සීමා නිර්ණය කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඉල්ලීමක් කරන ලදුව පහත සඳහන් කරුණු සාකච්ඡා කිරිම සඳහා 2016.09.01 දින රැස්වීමකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති කැඳවනු ලැබිය.

- සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්යාල පහසුකම්
- සීමා නිර්ණය කොමිෂන් සභාවට කාර්යාල මණ්ඩලයක් පත්කිරිම සහ
- 2016 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන

පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ද සීමා නිර්ණය කොමිෂන් සභාව කඩිනම් තීරණ ගත යුතු බවට එහිදී එකඟ විණ.

- කාර්යාල පහසුකම් සඳහා ඉඩකඩ සකසා ගැනීම.
- කාර්යාල මණ්ඩල අවශ්‍යතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීම.
- පිරිවැය සඳහා අයවැය ලේඛනයක් ,මහා භාණ්ඩාගාරයෙන් අනුමත කරවා ගැනීම.

කඩිනම් ක්‍රියාකාරි සැලැස්මට පහත සඳහන් කරුණු ඇතුලත් විය.

- කාර්යාල පහසුකම් සපයා ගැනීම.
- බැංකු ගිණුමක් විවෘත කිරීම.
- කාර්ය මණ්ඩලය පත් කර ගැනීම.
- කාර්යාල උපකරණ - ගෘහ භාණ්ඩ , පරිගණක , ඡායා පිටපත් යන්ත්‍ර ආදිය මිළදී ගැනීම.

මෙම පරිපාලනමය කාරණා ඉටුවන තුරු සාමාජිකයන්ගේ නිවෙස් වල නිතිපතා රැස්වීමට තිරණය විය. ඉන් පසුව 2016 නොවැම්බර් මස මිනින්දෝරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ කොමිෂන් සභා කාර්යාලය ආරම්භ කරන තුරු මේ අන්දමට රැස්වීම් 13 ක් පවත්වන ලදි.

## 3.2 සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්

2015.11.13 දින සිට 2016.12.31 දක්වා පහත සඳහන් පරිදි රැස්වීම් 15 ක් පැවැත්විය.

| | | | |
|---|---|---|---|
| 1 වන රැස්වීම | 2015.11.19 | 9 වන රැස්වීම | 2016.06.08 |
| 2 වන රැස්වීම | 2015.12.21 | 10 වන රැස්වීම | 2016.07.26 |
| 3 වන රැස්වීම | 2016.01.13 | 11 වන රැස්වීම | 2016.08.29 |
| 4 වන රැස්වීම | 2016.01.29 | 12 වන රැස්වීම | 2016.09.28 |
| 5 වන රැස්වීම | 2016.02.29 | 13 වන රැස්වීම | 2016.10.26 |
| 6 වන රැස්වීම | 2016.03.17 | 14 වන රැස්වීම | 2016.11.25 |
| 7 වන රැස්වීම | 2016.04.05 | 15 වන රැස්වීම | 2016.12.30 |
| 8 වන රැස්වීම | 2015.04.27 | | |

## 3.3 කාර්යාල පහසුකම් සහ ගෘහ භාණ්ඩ, උපකරණ හා ප්‍රවාහන පහසුකම්

**කාර්යාල පහසුකම්** : රාජකාරි පහසුව සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව ආසන්නයේ ස්ථානයක් තෝරා ගැනීම වැදගත් බවට සාමාජිකයෝ එකඟ වූහ. මිනින්දෝරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ප්‍රමාණවත් ඉඩපහසුකම් ඇති නිසාත් සර්වේයර් ජනරාල් ඒ සඳහා ඉඩකඩ පහසුකම් ලබාදීමට කැමැත්ත පළ කළ නිසාත් එම දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලෙහි සිය කාර්යාලය ස්ථාපනය කිරීමට සීමා නිර්ණය කොමිෂන් සභාව තීරණය කළාය. එම ගොඩනැගිල්ලෙ හි වර්ග අඩි 790 ක් පැවති අතර අවශ්‍යතාවට සරිලන සේ කාමර තුනකට වෙන්කල හැකි විය. වෙන් කිරීම් මිනින්දෝරු දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ඉටු කර දීමට සර්වේයර් ජනරාල් එකඟ විය. එහි පහසුකම් , විදුලි බලය ,ජල පහසුකම්, වාහන නැවැත්වීම් ආදි කරුණු සලකා බලා ඒවාට සාධාරණ වන කුලියක් නියම කරන ලෙස සීමා නිර්ණය කොමිෂන් සභාව සර්වේයර් ජනරාල් ගෙන් ඉල්ලා සිටින ලදි. මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් නිල ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අංක Cc/delc/1 හා 2016.02.11 දැනැති ලිපිය සර්වේයර් ජනරාල් වෙත යවන ලදි. ප්‍රතිසංස්කරණ කටයුතු මාස 6 ක් තුල සිදු කරගෙන ගිය අතර 2016 නොවැම්බර් මසට නියමිත වූ සීමා නිර්ණය කොමිෂන් සභාවේ 14 වැනි රැස්වීම පැවැත්වීමට සූදානම්ව පැවතිණි.

**වර්තමානයේ රාජකාරි ලිපිනය**

සීමා නිර්ණය කොමිෂන් සභාව

සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල

තැපැල් පෙට්ටිය 506

කොළඹ 05.

**කාර්යාල උපකරණ :**2016 සඳහා ඉදිරිපත් කරන ලද අයවැය කෙටුම්පතට ( 4 කොටස බලන්න) ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලත් ප්‍රතිපාදන වලට අනුකූලව 2016 හතර වැනි කාර්තුව වනවිට කාර්යාල උපකරණ මිලදී ගැනීමට හැකිවිය.

**ප්‍රවාහන පහසුකම් :**2016 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවට මෝටර් රථ දෙකක් අනුයුක්ත කරන ලදි. ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර තිබුණු, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් රක්ෂණය කරන ලද CAP 7180 දරණ රථය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත අනුයුක්ත කරන ලදි.

මුලදී මෙම වාහනය සඳහා රියදුරෙකු මැතිවරණ කොමිෂන් සභාව විසින් තාවකාලික ලෙස ලබා දෙන ලදුව සර්වේයර් ජනරාල් කාර්යාල භූමියෙහි රථය නැවැත්වා තැබිමට සර්වේයර් ජනරාල්ගේ අවසරය ලබා ගන්නා ලදී. දෙවැනි වාහනය වශයෙන් 2016 සැප්තැම්බර් මාසයේ දී CAR 0347 දරණ වාහනය ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අනුයුක්ත කරන ලදී. සීමා නිර්ණය කොමිෂන් සභාව මෙම දෙවැනි මෝටර් රථය වෙනුවට ඩබල් කැබ් රථයක් ලබා දෙන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටින ලදී. එහෙත් එය ඉටුකර දීමට නොහැකි බව භාණ්ඩාගාරය එම අවස්ථාවේදි දන්වන ලදී.

### 3.4 සීමා නිර්ණය කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලයක් පත්කිරිම:

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරයේ ප්‍රමාණය සලකා 2016.02.05 දිනැති DMS/1029 ලිපියෙන් කළමනාකාරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පහත සඳහන් තනතුරු අනුමත කරන ලදී.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | MN-7-2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරන සහකාර | ද්විතික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

වර්ෂය තුල සීමා නිර්ණය කොමිෂන් සභාවට පහත සඳහන් කාර්ය මණ්ඩලය පත් කිරිම් සිදු කරන ලදී.

(අ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ DC/Cadre/4/2 හා ලිපියෙන් 2016.03.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතිරේක මැතිවරණ කොමසාරිස් ආර්.එම්.ඒ.එල් රත්නායක මහතා අර්ධ කාලින පදනම මත සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කරන ලදී.

(ආ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ DC/Cadre/4/3 ලිපියෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ගණකාධිකාරි එච්.ඩබ්.එන් කුමාර මහතා 2016.03.28 දින ක්‍රියාත්මක වන පරිදි සීමා නිර්ණය කොමිෂන් සභාවේ අර්ධ කාලින ගණකාධිකාරි ලෙස පත් කරන ලදි.

(ඇ) සර්වේයර් ජනරාල්ගේ 2016.04.01 දිනැති CG/1/2/7/363 ලිපියෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තු වෙහි නලින් කුසුම්සිරි මහතා සීමා නිර්ණය කොමිෂන් සභාවේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් කටයුතු කිරීම සඳහා නිදහස් කරන ලදී. නලින් කුසුම්සිරි මහතා 2016.03.28 දිනැති DC/Cadre/4/5 ලිපියෙන් එම තනතුරට පත් කරනු ලැබිනි.

(ඈ) පරිපාලන නිලධාරියෙකු හා රාජ්‍ය කළමණාකරන සහකාර නිලධාරින් නොමැතිව කොමිෂන් සභාවේ කටයුතු කරගෙන යාමේ දුෂ්කරතාවය නිසා රාජ්‍ය කළමනාකාරණ සහකාර නිලධාරින් දෙදෙනෙකු හා රියදුරෙකු ලබා දෙන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ලිපියක් යවන ලදි. 2016.07.04 දින රාජ්‍ය කළමනාකරණ සහකාර නිළධාරීන් දෙදෙනකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලදි. ඔවුහු සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ මැතිවරණ දෙපාර්තුමේන්තුවේ හි පුහුණුව ලබා ගත්හ.

ඒ අනුව 2016.12.31 වන විට සීමා නිර්ණය කොමිෂන් සභාවේ හි කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි විය.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 (අර්ධකාලීන) | - |
| ගණකාධිකාරි | 01 | 01 (අර්ධකාලීන) | - |
| සම්බන්ධිකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 0 | 01 |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරන සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 0 | 02 |
| කාර්යාල කාර්ය සහයක | 02 | 0 | 02 |
| එකතුව | 15 | 05 | 10 |

## 3.5 ත්‍රෛමාසික ප්‍රගති වාර්තා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2016 ජනවාරි - මාර්තු , අප්‍රේල් - ජුනි හා ජුලි - සැප්තැම්බර් යන කාර්තු තුනට අදාළ ප්‍රගති වාර්තා ඉල්ලා සිටින ලදි. නියමිත දිනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත භාෂාත්‍රයෙන් එම වාර්තා යවන ලදි.

## 4 සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය කටයුතු

2016 වර්ෂය සඳහා රුපියල් මිලියන 16.2 ක් වූ අයවැය යෝජනා ( පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 15.4 හා ප්‍රාග්ධන වියදම් රු 800,000 - ඇමුණුම 1 ) ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පිටපතක් ද සහිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ප්‍රථම කාර්තුවේ දී යවන ලදි.

2016.03.16 දින ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ පුනරාවර්න වැය වශයෙන් 01-01-02-1405 යටතේ රුපියල් 10,000,000 ක් ද ප්‍රාග්ධන වැය වශයෙන් 01-01-02-2501 යටතේ රුපියල් 800,000 ක්ද යනුවෙන් රුපියල් මිලියන 10.8 ක් භාණ්ඩාගාරයෙන් අනුමත විය. ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් ඒ සඳහා රුපියල් 250,000 ක් ඉල්ලා 2016.11.23 දින එම ප්‍රතිපාදන ප්‍රමාණය සපයන ලදි.

සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින සිට පත් කරනු ලැබුවත් එහි සමාජිකයන් තමන්ට හිමි දීමනා පිළිබඳ ගෙවීම් කිරීම 2016.01.01 දින සිට සිදු කිරීම ප්‍රමාණවත් බවට එකඟත්වය පළ කළහ. ඒ අතර ස්වාධීන කොමිෂන් සභාවල සභාපතිවරුන්ගේ හා සාමාජිකයන්ගේ දීමනා වල සුලු වෙනසක් සිදුවන බව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දැනුම් දෙන ලදුව එම වෙනස්කම් දැනුම් දෙනතුරු එම දීමනා ගෙවීම කල් තබන ලදි. සභාපතිවරයාට සහ සමාජිකයන්ට දීමනා සිදු කරන ආකාරය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුමැතිය නිකුත් වූයේ 2016 මැද භාගයේදීය. සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරයෙන් ලද රුපියල් මිලියන2.0 ක මුදල සඳහා 2015.05.10 දින නාරාහේන්පිට ලංකා බැංකු ශාඛාවෙහි 7042792 දරණ ගිණුම විවෘත කරන ලදි. සභාපතිවරයාට ද , කොමසාරිස්වරුන්ට ද කාර්ය මණ්ඩලයට ද ( ලේකම් , ගණකාධිකාරි හා සම්බන්ධිකරණ ලේකම්) ද ගෙවීම් කිරීම 2016 ජුනි මස ආරම්භ විය. සීමා නිර්ණය කොමිෂන් සභාවට රාජ්‍ය කළමනාකාරන සහකාර නිළධාරින් පත් කෙරෙන තුරු සීමා නිර්ණය කොමිෂන් සභාවේ ගිණුම් පවත්වාගෙන යාමත්, ලියකියවිලි සකස් කර යතුරු ලියන කොට යැවීමටත්, පරිපාලන කටයුතු කරගෙන යාමටත් මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්ත රාජ්‍ය කළමණාකාර සේවා නිළධාරියකු අතිකාල පදනම යටතේ සහය වූයේය.

**වියදම්:**

2016 වර්ෂයේ වියදම රුපියල් මිලියන 7.2 ක් විය. එහි පුනරාවර්තන වියදම රුපියල් මිලියන 6.2 ක් ද ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 1.0 ක් ද අන්තර්ගත විය.

| වැය ශිර්ෂය | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | ඉතිරිය % |
|---|---|---|---|---|
| 01-01-02-1405 | 10,000,000.00 | 6,209,380.32 | 3,790,619.68 | 38% |
| 01-01-02-2501 | 1,050,000.00 | 1,031,665.64 | 18,334.36 | 2% |
| එකතුව | 11,050,000.00 | 7,241,045.96 | 3,808,954.04 | 34% |

කාර්යාල උපකරණ වියදම (ඇමුණුම 2 ) අයවැයෙන් 98% ක් ද, පුනරාවර්තන වියදමෙන් 38% පිරිවැය ඉතිරි වීමට හේතු වුයේ පහත සඳහන් කරුණුය.

- සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවැරුණු කාර්ය භාරය පිළිබඳ පැහැදිලි කාර්ය භාරයක් නොවු හෙයින් ඊට අදාළ ඉන්ධන හා ප්‍රවාහන සම්බන්ධයෙන් ඌන වියදම් තත්වයක් දක්නට ලැබේ.
- මිනින්දෝරු දොපාර්තමේන්තුව වෙතින් කාර්යාල පහසුකම් ලබා ගත් හෙයින් කුලි ගෙවිම හා පහසුකම් සඳහා වූ වියදම් වල ඉතිරියක් දක්නට ලැබේ. ජොෂ්ඨ තනතුරු 2 ක් සඳහා පත් කරනු ලැබුවේ ස්ථිර නිලධාරින් වෙනුවට අර්ථකාලින නිලධාරින් වූ නිසා එහි ඉතිරියක් සිදුවිය.
- අනුමත තනතුරු 10 ක් සඳහා පත්විම් කිරිමට සිදු වු ප්‍රමාද නිසා එහි ඌණ වියදම් තත්වයක් පෙන්නුම් කෙරේ.
- ස්වාධීන කොමිෂන් සභාවල සමාජිකයන්ට ගෙවිය යුතු දීමනා පිළිබඳව වෙනසක් සිදු වු හෙයින් එම ගෙවිම් වල වෙනසක් දක්නට ලැබිණ.

## 5. ප්‍රතිපත්තිමය කරුණු

### 5.1 2016 වර්ෂයේ ප්‍රගතිය

වර්ෂයේ ප්‍රථම කාර්තුවේදී ශ්‍රී ලංකාවේ සීමා නිර්ණ ඉතිහාසය හා සීමා නිර්ණය කොමිසමේ ක්‍රියාකාරිත්වය ට අවශ්‍ය පැහැදිලි කාර්ය භාරය , ප්‍රතිපත්ති හා කාර්ය රාමුවක අවශ්‍යතාව ආදිය පිළිබඳව සීමා නිර්ණය කොමිෂන් සභා සාමාජිකයන් අතර විද්‍යුත් තැපැල මගින් ලියකියවිලි හුවමාරු විය. ප්‍රථම සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කරනු ලැබු 1946 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිට

පසුකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිල වෙබ් අඩවි තොරතුරු හා සභාපතිවරයා විසින් සකස් කරන ලද ලියකියවිලි පදනම් කොට සීමා නිර්ණය පිළිබඳව මූලධර්ම හා මූලික කාර්ය රාමුව පිළිබඳව ලියවිල්ලක් ආචාර්ය ඩයස් බණ්ඩාරනායක විසින් ඉදිරිපත් කරන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් දෙන ලද උපදෙස් පරිදි සිය කාර්ය භාරය යටතේ පහත දැක්වෙන භූගෝලීය මායිම් නැවත සකස් කිරිම සඳහා යෝජනාවක් සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සම්පාදන කරන ලදි.

අ) පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස මායිම්

ආ) පළාත් වල මැතිවරණ කොට්ඨාස මායිම්

ඇ) පළාත් පාලන ආයතන කොට්ඨාස මායිම් (මහ නගර සභා , නගර සභා , ප්‍රාදේශීය සභා )

මීට අනුකූලව ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණයේ ඉතිහාසය හා සීමා නිර්ණයේ ඉතිහාසය පිළිබඳ පසුබිම පැහැදිලි කෙරෙන පත්‍රිකාවක් සභාපතිවරයා විසින් සකස් කරන ලදි. වෙනත් රටවල සීමා නිර්ණය පිළිබඳ ඓතිහාසික අත්දැකීම් පිළිබඳ පත්‍රිකාවක් පිළියෙල කිරිම මහාචාර්ය හස්බුල්ලා ට පැවරිණ. සෙසු සමාජිකයන් දෙදෙනා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව තමාගේ පත්‍රිකාව තවදුරටත් සකස් කිරිමට ආචාර්ය ඩයස් බණ්ඩාරනායකට පැවැරිණ.

දැනට පවත්නා මැතිවරණ හා පරිපාලනමය පද්ධතිය තුල ඇති ජනගහණය හා භූමි ප්‍රදේශයන් පිළිබඳ තොරතුරු එකතු කරන ලදි. ඉන්පසු ඉහත කරුණු සඳහා වූ පාදක ව්‍යුහයක් හා ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරිමට සීමා නිර්ණය කොමිෂන් සභාවේ කටයුතු කරන ලදි.

ප්‍රථමයෙන්ද සඳහන් කරන ලද පරිදි අලුතින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාව ඉටුකළ යුතු කාර්යභාරය පිළිබඳව පැහැදිලි කිරිමක් දක්නට නොලැබේ. මේ අතර මැතිවරණ කොට්ඨාස හා පරිපාලන ප්‍රදේශ සීමාවන් නිර්ණය කිරිමට විවිධ ආකාරයේ අණ පනත් පනවා තිබේ. මෙම සීමා නිර්ණය කිරිම් රටේ ප්‍රශස්තම යහපත සඳහා යොදා ගැනීමට හැකිවන ආකාරයට තර්කානුකූල ලෙස ගැලපිය යුතුව ඇත. මෙම කාර්යයෙහි ලා ව්‍යවස්ථාමය සංශෝධනයක් මගින් " සීමා නිර්ණය කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් පුලුල් කිරිම" සම්බන්ධයෙන් වූ යෝජනාවක් තෙවැනි කාර්තුවේදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති වෙත යවන ලදි. ( ඇමුණුම 3 ) මෙම යෝජනාවම " නව ව්‍යවස්ථාවක් සකස් කරන විට හෝ පවත්නා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන කරන විට සීමා නිර්ණය කොමිෂම සම්බන්ධයෙන් සැලකිල්ලට ගතයුතු කරුණු" යනුවෙන් සභාපතිවරයා සකස් කළ ඇමුණුමක් ද සහිතව රාජ්‍ය සේවා පිළිබඳ අනු කමිටුවේ සභාපති වෙත යවන ලදි. යෝජනාව අනුකමිටුව විසින් සලකා බලන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරන මෙහෙයුම් කමිටුවේ අවධානය සඳහා යොමු කෙරෙන "ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය පිළිබඳ මූලධර්ම හා පාදක ව්‍යුහය"

යනුවෙන් ලියවිල්ලක් (ඇමුණුම 5 ) එම කමිටුවේ සභාපති වන ගරු අගමැතිතුමා වෙත 2016 ඔක්තෝම්බර් මාසයේදී යවන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාව මේ සියලු යෝජනා සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටී.

### 5.2 ජනතාවගෙන් ලද යෝජනා සම්බන්ධයෙන් ලද ජනතා ප්‍රතිචාර

(අ) රාගම තේවත්ත අංක 546 හි පදිංචි රොබට් ඇන්තනි ( සා.වි ) මහතා නව පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාසයක් පිහිටුවීම පිළිබඳව කරන ලද යෝජනාව : රොබට් ඇන්තනි මහතා රාගම සඳහා වෙනමම මැතිවරණ කොට්ඨාසයක් ඇති කරන ලෙස කරන ලද ඉල්ලීමක් ජනාධිපතිවරයාට හා වෙනත් අයට පිටපත් සහිතව කථානායකවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. ඔහුගේ යෝජනාව මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කෙරෙන අවස්ථාවේදී සැලකිල්ලට ගන්නා බව ඔහු වෙත දැනුම් දීමට තීරණය විය.

(ආ) නව මැතිවරණ කොට්ඨාසයක් ඇති කිරිම සම්බන්ධයෙන් විශ්‍රාමික විදුහල්පතිවරයෙකු වන ජී. ඩී රත්නායක මහතා ඉදිරිපත් කළ යෝජනාව : වර්තමාන කොලොන්න මැතිවරණ කොට්ඨාසය දෙකට බෙදන ලෙස රත්නායක මහතා යෝජනා කරයි. එම ඉල්ලීම මැතිවරණ සීමා නිර්ණය කෙරෙන අවස්ථාවේ දී සැලකිල්ලට ගන්නා බව ඔහු වෙත දැනුම් දීමට තීරණය විය.

### 5.3 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය සහ 2017 සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම

සීමා ( මැතිවරණ හා පරිපාලනමය ) නිර්ණය කිරිම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයකි. එබැවින් එම සීමා නිර්ණය පිළිබඳ අවශ්‍යතාවන් හා මානයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලි කොට දැක්විය යුතුවේ. එබැවින් වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් කළ යුතු කාර්යය සම්බන්ධයෙන් පැහැදිලි මගපෙන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය වී තිබේ.

මැතිවරණ දිස්ත්‍රික්ක සීමා නිර්ණය ක්‍රියාවලියේ අවස්ථා දෙකක් ඇත. ව්‍යවස්ථාදායකයේ ආසන සංඛ්‍යාව ප්‍රාදේශීය ඒකකයන් අනුව දිස්ත්‍රික්ක හෝ පළාත් වලට හිමි වන ආකාරය තීරණය කිරීම ප්‍රථම අවස්ථාවයි. ඒ ඒ දිස්ත්‍රික්ක වල හෝ පළාත් වල ජනගහණය අනුව ආසන බෙදා දීම සිදුවන මෙම අවස්ථාව හුදෙක් යාන්ත්‍රික ක්‍රියාවලියක් වේ. සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් කර ඇති මූලික අධ්‍යයනයන් හා සාකච්ඡා අනුව පෙනීගොස් ඇත්තේ ආසන සංඛ්‍යාව බෙදා දිමේ දී සැලකිය යුතු එකම කාරණය ජනගහණය නොවන බවයි. ඒ ඒ ජනගහණයන් තුල ස්වකීය අපේක්ෂාවන් පිළිබඳ පවත්නා බහු විවිධත්වය, ඒ ඒ ඡන්ද කොට්ඨාසය තුළ පවත්නා භූමි ප්‍රමාණය හා ගමනාගමනයේ දී බලපාන භූ විෂමතාවය ආදි කරුණු ද මෙහි ලා සැලකිල්ලට ගතයුතු කරුණුවේ. මෙම කරුණු පිළිබඳව සැලකිල්ලට භාජනය කළයුතු මිනුම් දඬු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වේ හෝ අණ පනත් වල සඳහන් වේ. දෙවැනි පියවර වන්නේ පවත්නා මැතිවරණ දිස්ත්‍රික්ක වල මායිම් වෙනස් කිරිම හා / හෝ දිස්ත්‍රික්කය හෝ පළාත තුළ නව මැතිවරණ දිස්ත්‍රික්ක ඇති කිරිමය. මෙය සාමාන්‍යයෙන් ම කෙරෙනුයේ සීමා නිර්ණය කොමිෂන් සභාවක් මගිනි. එබැවින් එම දෙවැනි පියවර ආරම්භ කිරිමට මත්තෙන් ප්‍රථම

පියවරට අදාල මූලධර්ම හා පාදක ව්‍යුහයන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව පැහැදිලිව දැක්විය යුතු වේ.

වර්ෂය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනසක් සිදු නොවූ හෙයින් 2017 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිමේ දි සීමා නිර්ණය කොමිෂන් සභාවට ගැටලුවකට මුහුණ දිමට සිදු විය. සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යභාරය පැහැදිලි නැති හෙයින් කොමිෂන් සභාව සඳහා වූ දැක්ම හෝ මෙහෙවර ප්‍රකාශය සකස් කිරිම අසීරු වී තිබේ. වාර්ෂික අයවැය සම්පාදනයේ දී භාණ්ඩාගාරයට අවශ්‍ය බව දන්වා තිබු බැවින් සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා දැක්මක් , මෙහෙවර ප්‍රකාශයක් , අරමුණු හා ප්‍රගතිය මැනීමේ දර්ශකයන් සකස් කොට ඉදිරියේදී අවශ්‍ය වෙනස් කිරිම් සිදු කිරිමට යටත් ව ඉදිරිපත් කරන ලදි.

පසුගිය වර්ෂය තුළ කරන ලද අධ්‍යනයන් , සංවාද හා වාද විවාද තුළින් ලද අත්දැකිම් ද උපයෝගී කොට ගෙන සීමා නිර්ණය කොමිෂන් සභාව සිය දැක්ම , මෙහෙවර ප්‍රකාශය හා අරමුණු කාලානුකූලව සංශෝධනය කළාය. කොමිෂන් සභාවේ හි 2017 ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිමේදී පහත දැක්වෙන කරුණු ඇතුලත් කිරිමට තීරණය කර තිබේ.

1. තොරතුරු එක්රැස්කිරිම ( පළාත් පාලන ආයතන පිහිටුවිමට අදාළ ගැසට් නිවේදන සියල්ල එක් රැස්කිරිමට පියවර ගෙන ඇත.)
2. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා භූමි ප්‍රමුඛතාවන් පිළිබඳව සලකා බැලිමට අවශ්‍ය වන පූර්වගාමි සීමා නිර්ණය කොමිෂන් සභාවල වාර්තා විශ්ලේෂණ කිරිම.
3. 2012 අංක 22 පනතෙන් ස්ථාපිත කරන ලද පළාත් පාලන ආයතන සඳහා වූ ජාතික සීමා නිර්ණය කමිටුවේ වාර්තා වෙන් ලැබි ඇති තොරතුරු විශ්ලේෂණය කිරිම.

## 6. ස්තුතිය

සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති හා සමාජිකයන්

(1) සීමා නිර්ණය කොමිෂන් සභාවට හා එහි කාර්ය මණ්ඩලයට ස්ථිර කාර්යාලයක සිට නිල රාජකාරි කිරිමට කාර්යාල ඉඩකඩ හා අනෙකුත් පහසුකම් ලබා දිම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල්ටත්

(2) නිලධාරින් නිදහස්කර දිම , පුහුණු කර දීම වැනි කාර්යයන් ඇතුලුව වෙනත් බොහෝ පහසුකම් හා අවශ්‍යතාවන් සපුරා දීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුලු කොමිෂන් සභාවටත් එහි අනෙකුත් කාර්ය මණ්ඩලයටත්

(3) අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා වාහන ලබා දීමේදී සහය දැක්වූ ජනාධිපති ලේකම්තුමා ඇතුලු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හා මහා භාණ්ඩාගාරයේ කාර්ය මණ්ඩලයටත්

(4) අවශ්‍ය සහය දුන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාටත්

සිය කෘතඥතාව පළ කරති.

**ඇමුණුම 1**

**2016 අයවැය කෙටුම්පත**

| විස්තරය | | එකතුව (රුපියල්) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| | | |
| **පෞද්ගලික දීමනා** | | |
| 1001 | වැටුප් හා වේතන | 7,393,380.00 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 25,000.00 |
| 103 | වෙනත් දීමනා | 4,030,548.00 |
| **ගමන් වියදම්** | | |
| 1101 | දේශීය | 50,000.00 |
| **සැපයුම් වියදම්** | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 100,000.00 |
| 1202 | ඉන්ධන | 1,354,860.00 |
| 1203 | වෙනත් | |
| **නඩත්තු වියදම්** | | |
| 1301 | වාහන | 00 |
| 1302 | යන්ත්‍ර උපකරණ | 25,000.00 |
| **සේවා** | | |
| 1401 | ප්‍රවාහන | 1,800,000.00 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 250,000.00 |
| 1403 | විදුලිය හා ජලය | 75,000.00 |
| 1404 | කුලී හා දේශීය බදු | 300,000.00 |
| 1405 | වෙනත් | |
| **මාරුකිරීම්** | | |
| 1505 | සාමාජික මුදල් හා දායක මුදල් | 00 |
| 1506 | රජයේ නිලධාරින් සඳහා වූ දේපල ණය | 00 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | | 15,403,788.00 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| | | |
| **ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම්** | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 800,000.00 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 00 |
| **ධාරිතා වර්ධනය** | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණුව | 00 |
| **ප්‍රාග්දන වියදම් එකතුව** | | **800,000.00** |

| | | |
|---|---|---|
| **වියදම් පූර්ණ එකතුව** | | **16,203,788.00** |

ඇමුණුම 2

**2016.12.31 දින වන විට සීමා නිර්ණය කොමිෂන් සභාවේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ**

| අයිතමය | සංඛ්‍යාව |
|---|---|
| පරිගණක - උපාංග සහිතව | 02 |
| යූපීඑස් (UPS) | 02 |
| මුද්‍රණ යන්ත්‍ර ( printer) | 01 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 01 |
| ෆැක්ස් යන්ත්‍ර | 01 |
| වානේ කැබිනට් | 03 |
| ගණක යන්ත්‍ර | 02 |
| විධායක පුටු ( කුෂන් සහිත) | 03 |
| විධායක මේස ( විශාල) | 03 |
| විධායක මේස ( සාමාන්‍ය) | 03 |
| විධායක පුටු (සාමාන්‍ය) | 02 |
| පරිගණක මේස | 02 |
| පරිගණක මේස සඳහා පුටු | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර මේස | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර පුටු | 02 |
| පරිපාලන නිලධාරි පුටු | 02 |
| ආලින්ද පුටු | 06 |
| විදුලි කේතල | 01 |

**ඇමුණුම 3**

2016.07.07

මගේ අංක DC/SC/PowersDC/1

ගරු කරු ජයසූරිය මැතිතුමා

සභාපති

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව,

කථානායක කාර්යාලය,

පාර්ලිමේන්තු සංකීර්ණය,

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ගරු මැතිතුමනි,

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් පුලුල් කිරිම.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද දහනවවන ආණ්ක්‍රම සංශෝධනයට අනුකූලව 2015 නොවැම්බර් 13 දින 41ආ හා 95(1) ව්‍යවස්ථාවන් යටතේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සීමා නිර්ණය කොමිෂන් සභාව පත්කරන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාව සිය කටයුතු ආරම්භ කිරිම සඳහා එහි සිය කාර්ය භාරය ව්‍යවස්ථානුකූල ලෙස තහවුරු කොට , නියමිත පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව නියම කොට සීමා නිර්ණය කිරීම සඳහා නියමයන් ලැබෙන තුරු අපේක්ෂාවෙන් සිටින්නිය.

ඒ අතර , සීමා නිර්ණය කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද දින සිට ස්ථාවර කාර්යාලයක් පිහිටුවිම , වැනි ඊට අදාළ පරිපාලනමය අවශ්‍යතා සපුරා ගනිමින් ද සීමා නිර්ණය පිළිබඳ ගෝලීය අත්දැකිම් ද පූර්වගාමි ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ සීමා නිර්ණය කොමිෂන් සභාවල ඉතිහාසය හා කටයුතු අධ්‍යයනය කරමින් ද සිටින්නිය. මෙම ව්‍යායාමයේදී විවිධ වකවානු වල පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස පළාත් පාලන ප්‍රදේශ හා පරිපාලන බල ප්‍රදේශ පිළිබඳ සීමා නිර්ණයන් කිරිමෙහි වගකිම යම් යම් ආයතනවලට පවරා තිබුණු බව දැනගත හැකිවිය. මෙම තත්වය නිසා ඒ ඒ මට්ටම් වල ජනතාවගේ දේශපාලන නියෝජනය ඇතුළු තොරතුරු වල අසංගත භාවයක් හා අකාර්යක්ෂමතාවක් විද්‍යමානවන්නට විය. අද භාවිතා වන ආකාරයට පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද ප්‍රදේශ 160 ක් පවතින අතර පළාත් පාලන ආයතන 336 ක් පවතී. ඒ අතරම රාජ්‍ය පරිපාලන සම්ප්‍රදාය යටතේ ග්‍රාම

නිලධාරි කොට්ඨාස 14,021 ද ඒවා ඒකාබද්ධ කෙරෙන දිස්ත්‍රික්ක 25 ක ප්‍රදේශිය ලේකම් කොට්ඨාස 331 ක් ඇත. රාජ්‍ය අංශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාස 340 ක් ද, අධ්‍යාපන කොට්ඨාස 311 ක් ද, පොලිස් බල ප්‍රදේශ 439 ක් ඇත. මේ රාජ්‍ය සේවය සඳහා වූ ප්‍රදේශ බෙදුම් වර්ග අතරින් කිපයක් පමණි. මේ සමහර බෙදීම් වලින් ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ඡේදනය වේ. රාජ්‍ය සේවයේ බෙදීම් ධුරාවලියට අනුකුලව භූගෝලිය වශයෙන් සුසංගත භාවයක් නොතිබිම නිසා රටේ සංවර්ධන කටයුතු වලට බාධා පැමිණෙන අවස්ථා ඇත. ඒ නිසා රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනිකුත් අංශ අතර සම්බන්ධිකරණයටද බාධා පැමිණේ. තවද එකම තලයේ පරිපාලනමය බෙදීම් වලද බරපතල වෙනස් කම් දක්නට ලැබේ. උදාහරණ වශයෙන් රාජ්‍ය පරිපාලනයේ ඇති කුඩාම ඒකකය වන ග්‍රාම නිලධාරි කොට්ඨාස ගත් කල මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසට ඇතුළත් වර්ග කිලෝමිටර් 2 ක භූමි ප්‍රමාණය තුල 28,000ක ජනගහණයක් දක්නට ලැබෙන අතර වර්ග කිලෝමිටර 560 ක් වන පානම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ජනගහණය 1209 කි. තවත් ග්‍රාම නිලධාරි කොට්ඨාස වල පුද්ගලයන් ඇත්තේ 100 කටත් අඩු සංඛ්‍යාවකි. (2012 ජන හා නිවාස සංගණනය ) විවිධ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවාවන් පරිපාලන ප්‍රදේශ හැඳින්විමට එකම නාමකරණයක් භාවිතා නොකොට විවිධ නම් යොදා ගැනිම හේතු වෙන් ද මහජනතාවට හා පරිපාලකයන්ට දුෂ්කරතා වලට මුහුණ දිමට සිදු වි ඇත. උදාහරණ වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණ දිස්ත්‍රික්ක 22 ක් තිබෙන අතර රාජ්‍ය පරිපාලනයෙහි ලා දිස්ත්‍රික්ක 25 ක් තිබේ. පරිපාලන දිස්ත්‍රික්කයකට වර්ග කිලෝමිටර දහස් ගණනක් ඇති අතර භූමි ප්‍රමාණයෙන් එය දෙවැනි වනුයේ පළාතකටයි.

ඡන්දයෙන් නියෝජිතයන් පත්වන ආයතන හා පරිපාලන ප්‍රදේශයන් හි සීමා නිර්ණය කිරිමේ කාර්යය සඳහා මැනවින් සංවිධානාත්මක වූ ස්ථාවර ආයතනයක් තිබිය යුතුය. එය මැනවින් සකස් වූ මූලධර්ම පද්ධතියක් සහිත පාදක ව්‍යුහයක් ( Frame work) තුළ ක්‍රියාත්මක විය යුතුය. එම මූලධර්ම පද්ධතිය කලින් කලට සමාලෝචනය විය යුතුය. සංශෝධන විය යුතුය. රටක ජනගහන සංයුතිය නිරන්තරයෙන් වෙනස් වන බැවින් මහනගර සභා , නගර සභා හා ප්‍රාදේශිය සභා අලුතින් ඇති කිරිම, ඒකාබද්ධ කිරිම හා උසස් කිරිම විශේෂයෙන් සෑම ජන සංගණයකටම පසුව සිදුවන අඛණ්ඩ ක්‍රියාවලියක් විය යුතුය. දැනටමත් නව පලාත් පාලන ආයතන ඇති කරන ලෙස ඉදිරිපත් වී ඇති ඉල්ලීම් රැසක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ තීරණය අපේක්ෂාවෙන් සිටි. දැනට පවත්නා ක්‍රමය වනුයේ එවැනි ඉල්ලිමක් ඉදිරිපත් වූ විට රජය ( ඇමතිවරයා ) එක් සමාජිකයෙකුගෙන් හා කීප දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් එම ඉල්ලීම් සලකා බැලීමයි. මෙවැනි ක්‍රියාමාර්ගයකින් සමතාවක් පවත්වාගෙන යා නොහැකිය. එවැනි ඉල්ලීම් සියල්ල එක් සීමා නිර්ණය කොමිෂන් සභාවකට යොමුකළ විට ඒ සියල්ලට පොදු සමතාවකින් යුතු මානයන් මගින් සහ එක සමාන වූ පාදක ව්‍යුහයක් හා මූලධර්ම පද්ධතියක් මගින් තිරණ ලබා දිය හැකිය.

මේ පසුබිම යටතේ පාර්ලිමේන්තු , පළාත් සභා හා පළාත් පාලන යන නියෝජිත ආයතන වලට අදාළ සියලුම සීමා නිර්ණයන් කිරිමට නෛතික අධිකාරියක් ඇති එක් ස්ථාවර සීමා නිර්ණය කොමිෂන්

සභාවක් ඇති කළ යුතු යයි, මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව යෝජනා කරයි. මහජන නියෝජන ආයතනවලට අමතරව සියලුම රාජ්‍ය සේවාවන් ( ගොවිජන , අධ්‍යාපන , සෞඛ්‍ය , අධිකරණ, පොලිසිය රාජ්‍ය පරිපාලන ආදි සේවාවන් ) සඳහා ද එකම ස්ථිර පරිපාලන ප්‍රදේශ ක්‍රමයක අවශ්‍යතාව කඩිනම් අවධානයට යොමුවිය යුතු කරුණකි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන සීමා නිර්ණය කොමිෂන් සභාවට සියලුම ආකාරයේ සීමා නිර්ණය කිරිම සඳහා අවශ්‍ය බලතල හා කාර්යයන් පුලුල් ලෙස ලබාදීම සුදුසු බව කොමිෂන් සභාව නිර්දේශ කරනු කැමතිය. එයින් ලද හැකි ප්‍රයෝජන පහත සඳහන් වේ.

1. සීමා නිර්ණය - මායිම් සලකුණු කිරීම සංගත හා සමතාවයකින් යුතුව පවත්වා ගෙන යා හැකිය.
2. සීමා නිර්ණය සම්බන්ධයෙන් පොදු ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළ හැකිය.
3. ජනතාවට හා රජයට වගකියන එක් ආයතනයක් බිහි වේ.
4. සීමා නිර්ණයෙහි ලා දරණ පිරිවැය විශාල වශයෙන් අඩු කළ හැකිය.
5. සීමා නිර්ණය සඳහා එක් ස්ථාවර ආයතනයක් බිහිවූ විට සීමා නිර්ණය කටයුතු සඳහා උපයෝගි කරගත හැකි ඉහළ කාර්යක්ෂමතාවකින් යුත්, විශේෂ දැනුමක් හා විශේෂඥතාවකින් පුහුණු කාර්ය මණ්ඩලයක් බිහිවේ
6. මෙවැනි ආයතනික ව්‍යුහයකින් ප්‍රාදේශිය මහජන නියෝජන ආයතනය හා රාජ්‍ය සේවා පරිපාලනය සම්බන්ධයෙන් මතුවන සීමා පිළිබඳ ගැටලු පහසුවෙන් නිරාකරණය කරගත හැකිය.

මෙම කරුණු ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරනු කැමැත්තෙමු.

සභාපති
සීමා නිර්ණය කොමිෂන් සභාව

## ඇමුණුම 4

**සීමා නිර්ණය කොමිෂන් සභාව පිළිබඳව අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී හෝ නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමේදි සැලකිල්ලට ගත යුතු කරුණු**

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| 95<br>(1)ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුලත මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව ක් ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දේශපාලන කටයුතු වල නිරතව නොවන්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන්දෙනෙකු ගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුත්තේය. ඔවුන් අතුරින් එක් තැනැත්තෙකු ඒ කොමිෂන් සභාවේ සභාපතිධූරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය.<br><br>(2)සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් කිසි සමාජිකයෙකු මිය ගියහොත් නැත්නම් යම් කිසි සමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සමාජිකයෙකු වශයෙන් සිය කර්තව්‍යය යථාපරිදි ඉටු කළ නොහැකි යයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුත්තේය. | 95<br>(1)අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භවීමෙන් පසුව මාස තුනක් ඇතුළත මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරිම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ. ජනාධිපතිවරයා පත් කර, දේශපාලන කටයුතු වල නිරතව නොවන්නා වු තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනෙකුගෙන් ඒ කොමිෂන් සභාව සමන් විත විය යුතුය. ඔවුන් අතුරින් එක් තැනැත්තෙක් ඒ කොමිෂන් සභාවේ සභාපතිධූරයට ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුත්තේය.<br><br>(2)සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් සමාජිකයෙකු මියගියහොත් නැත්නම් යම් කිසි සාමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍යය යථාපරිදි ඉටු කළ නොහැකියයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙක් පත් කරනු ලැබිය යුත්තේය. |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| | **95 දරණ ව්‍යවස්ථාවට අනතුරුවම පහත දැක්වෙන ව්‍යවස්ථාවන් ඇතුළත් කරනු ලැබිය යුතු වන අතර ඒවා 95 අ , 95 ආ , 95 ඇ , 95 ඈ , 95 ඉ , 95 ඊ , 95 උ , 95 ඌ ව්‍යවස්ථාවන් ලෙස බලාත්මක විය යුත්තේය.**<br><br>95 අ. කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය : කොමිෂන් සභාවේ කටයුතු මැනවින් ඉටු කර ගැනිම සඳහා කොමිෂන් සභාව විසින් පනවනු ලබන කොන්දේසි යටතේ ලේකම් වරයෙක් පත්කරනු ලැබිය යුත්තේය.<br><br>95 ආ. කොමිෂන් සභාවේ වියදම් :<br>කොමිෂන් සභාව සඳහා ඒකාබද්ධ අරමුදලට බැර වන සේ වාර්ෂික අයවැයක් පිළියෙල කළ යුතුය. කොමිෂන් සභාවෙහි සභාපති හා සමාජිකයන්ට අමාත්‍ය මණ්ඩලය තිරණය දිමනා ගෙවිය යුතුය. ඒ දිමනා ඒකාබද්ධ අරමුදලට බැර විය යුතුය.<br><br>95 ඇ. කොමිෂන් සභාවේ රැස්විම්:<br>කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරිම සඳහා ප්‍රමාණවත් වන පරිදි වාර ගණනක් රැස්විය යුතුය. කොමිෂන් සභාවේ සෑම රැස්විමක් ම සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතුය. සභාපතිවරයා නොමැති අවස්ථාවකදී වෙනත් සමාජිකයෙක් සභාපතිවරයා වශයෙන් ක්‍රියාකළ යුතුය. |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| | 95 ඇ. සාමාජිකයන් අතරේ අදහස් විවිධ වන අවස්ථාවලදි සාමාජිකයන් වැඩි දෙනෙකු ගේ මතය කොමිෂන් සභාවේ මතය සේ සැලකිය යුතුය. සාමාජිකයන් එකිනෙක වෙනස් මත දරණ අවස්ථා වලදි සභාපතිවරයා දරණ මතය කොමිෂන් සභාවේ මතය සේ සැලකිය යුතුය.<br><br>95 ඉ. ජාතික පළාත් හා ප්‍රාදේශිය වශයෙන් පාර්ලිමේන්තු , පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද පැවැත්විම සඳහා අවශ්‍ය භූගෝලිය සීමාවන් නිර්ණය කිරිම , අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ව්‍යවස්ථා සංශෝධන වල දක්වා ඇති මූල ධර්මයන්ට හා මානයන්ට අනුකූලව කොමිෂන් සභාව විසින් තිරණය කළ යුතු වන්නේය.<br><br>95 ඊ. ජාතික ජන සංගණනයක් නිමවී වසර දෙකක් තුළ දී සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ජන සංයුතියේ වෙනස් විම් රටාවට අනුකූලව ඡන්ද කොට්ඨාස වල භූගෝලිය සීමා මායිම්, සමාලෝචනයට හා පුනරීක්ෂණයට භාජනය කළ යුතුය. එවැනි පුනරීක්ෂණය කුමන පදනමක් මත සිදුවන්නේද ඒ අනුව පුනරීක්ෂණය වන්නේ ද යන්න මහජනතාව දැනුවත් කරමින් විනිවිද බවින් වන පරිදි සිදු කළ යුතුය. |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| | 95 උ. පළාත් සීමා හා පරිපාලන දිස්ත්‍රික් මායිම් නිර්ණය කිරීම : පළාත් සීමාවන් හා පරිපාලන දිස්ත්‍රික් සීමාවන් වෙනස් කිරීමට අවශ්‍ය වන විට අදාළ අමාත්‍යාංශ විසින් පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව එම යෝජනා සීමා නිර්ණය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.<br><br>95 ඌ .නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස , නව ග්‍රාම නිලධාරී කොට්ඨාස සීමා මායිම් , පවත්නා ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම් සංශෝධන පළාත් පාලන ආයතන අලුතින් පිහිටුවීම, පළාත් පාලන ආයතනයන් උසස් කිරීම හා ඒවායේ මායිම් සංශෝධනය කිරීම , වෙනස් කිරීම යන කරුණු සීමා නිර්ණය කොමිෂන් සභාව මගින් ඉටු කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| 96. | 96. |
| (1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට නොඅඩු වූද , විසි පහකට (25) නොවැඩි වූ ද මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාස යට නමක් ද දිය යුත්තේය. | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය. |
| (2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සමන්විත විය හැක්කේය.නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය. |

| | |
|---|---|
| සංඛ්‍යාවකට බෙදිය හැක්කේය. | |
| **දැනට පවත්නා ව්‍යවස්ථාව** | **යෝජිත ව්‍යවස්ථාව** |
| (3) පළාතක් මැතිවරණ කොට්ඨාස වලට බෙදනු ලබන අවස්ථා වකදී හැකිතික් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විතවන බවට වගබලාගනු පිණිස සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් , එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේය. | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය |
| (4) එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාස වලට ( ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ජන්ද හිමි නාම ලේඛනයේ නම් දැක්වෙන ජන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරා පත් කිරිමට හිමිකම් ඇති මන්ත්‍රිවරයන් සංඛ්‍යාවට අමතරව) එක් ව මන්ත්‍රිවරයන් සිව් දෙනෙකු තෝරා පත් කර ගැනිමට හිමිකම් ඇත්තේය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේය. | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය. |
| (5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සමාජිකයන් අතර මත භේදයක් ඇති වුව හොත් සාමාජිකයන් අතුරෙන් වැඩිදෙනා ගේ මතය බලපැවැත් විය යුතු අතර, එය කොමිෂන් සභාවේ තිරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සියලු දෙනාම එකිනෙකට වෙනස් මත දරන්නේ නම් කොමිෂන් සභාවේ සභාපතිවරයා ගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයිනම් ඔහුට එසේ එකඟ නොවිමට හේතු දැක්විය හැක්කේය. | (5)සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මත භේදයක් ඇති වුවහොත් ඒ සාමාජිකයන්අතුරෙන් වැඩි දෙනාගේ මතය බලපැවැත්විය යුතු අතර , එය කොමිෂන් සභාවේ තිරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සියලු දෙනාම එකිනෙකට වෙනස් මත දරන්නේ නම් කොමිෂන් සභාවේ සභාපතිවරයා ගේ මතය කොමිෂන් සභාවේ තිරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තිරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයි නම් ඔහුට එසේ එකඟ නොවිමට හේතු දැක්විය හැක්කේය. |

| | |
|---|---|
| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
| (6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති කොමිෂන් සභාවේ තීරණයද එකී තීරණයට එකඟ නොවන සාමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයා ට දැන්විය යුත්තේය | (6)සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය. |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| 1978 ව්‍යවස්ථාවේ 62 (I) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව සංස්ථාපනය කරනු ලබන වෙන් වෙන් මැතිවරණ කොට්ඨාසවල ජන්ද දායකයන් විසින් තෝරාපත්කර ගනු ලබන මන්ත්‍රිවරයන් එකසිය අනූහය දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් වන්නේය. | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය. |
| **1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාවේ දහ හතර වන සංශෝධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 ව්‍යවස්ථාවේ 3 වැනි සංශෝධන වගන්තිය** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වන ව්‍යවස්ථාව එහි(I) වන ව්‍යස්ථාව ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අනු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් , මෙයින් සංශෝධනය කරනු ලැබේ (I) අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව තෝරා පත් කරගනු ලබන මන්ත්‍රිවරයන් දෙසිය විසිපහස් දෙනෙකු ගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් වන්නේය" (මන්ත්‍රිවරයන් 225 අතුරෙන් 196 ක් මන්ත්‍රීන්වරුන් මැතිවරණ දිස්ත්‍රික්ක 22 න් තෝරා ගනු ලැබේ. ඉතිරි මන්ත්‍රිවරයන් 29 දෙනා ජාතික මට්ටමේ ලබා ගන්නා ජන්ද ප්‍රමාණයට සමානුපාතිකව පක්ෂ වලින් හා ස්වාධින | නව මැතිවරණ ක්‍රමය අනුව සංශෝධනය කළ යුතුය. |

| | |
|---|---|
| කණ්ඩායම් වලින් ජාතික ලැයිස්තුවෙන් තෝරා ගනු ලැබේ) | |

| දැනට පවත්නා ව්‍යවස්ථාව | යෝජිත ව්‍යවස්ථාව |
|---|---|
| **1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහතර වැනි සංශෝධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96 අ ව්‍යවස්ථාවේ 5 වැනි සංශෝධන වගන්තිය** | |
| 96අ. මැතිවරණ කොට්ඨාස කලාප වලට බෙදීම<br>(1) මන්ත්‍රීවරයන් දස දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කිරිමට හිමිකම් ඇති මැතිවරණ කොට්ඨාස කලාප වලට බෙදීම අවශ්‍ය අවස්ථාවන් හි මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමෙන් සති දෙකක් ඇතුළත , ඒ කාර්යය සඳහා, දේශපාලන කටයුතුවල ක්‍රියාකාරිව නිරතව නොසිටින්නා වු තැනැත්තන් තුන් දෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය. ඔවුන් අතුරෙන් එක් තැනැත්තකු ඒ කොමිෂන් සභාවේ සභාපති ධූරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය. | 95 ව්‍යවස්ථාවෙන් ආවරණය වේ. |
| (2)සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම්කිසි සාමාජිකයකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස්වුවහොත් එසේත් නැත්නම් , යම් කිසි සාමාජිකයකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍යය යථා පරිදි ඉටු කළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් , මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව , ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුත්තේ ය. | 95 ව්‍යවස්ථාවෙන් ආවරණය වේ. |

| | |
|---|---|
| | |
| **දැනට පවත්නා ව්‍යවස්ථාව** | **යෝජිත ව්‍යවස්ථාව** |
| අස්වුවහොත් එසේත් නැත්නම් , යම් කිසි සාමාජිකයකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍යය යථා පරිදි ඉටු කළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් , මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව , ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුත්තේ ය.<br><br>(3) වාර්ගික වුව ද , ආගමික වුව ද නැතහොත් එවැනි වෙනත් යම් ආකාරයක වූව ද පොදු සම්බන්ධතාවක් නිසා එකමුතු වූ එහෙත් මැතිවරණ කොට්ඨාසයේ බහුතර ඡන්ද හිමියන්ගෙන් ඒ එක් ආකාරයකින් හෝ ඊට වැඩි ආකාරයකින් වෙනස් වන්නා වූ තැනැත්තන්ගේ හෝ සැහෙන ඒකරාශි විමක් මන්ත්‍රීවරයන් දස දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් තෝරාපත් කිරීමට හිමිකම් ඇති මැතිවරණ කොට්ඨාසයක පවත්නා බව සීමා නිර්ණය කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක , කරුණු පළකර සිටීමට මහජනයාට අවස්ථාවක් දීමෙන් අනතුරුව , ඒ පොදු සම්බන්ධතාවයට නියෝජනයක් ලැබෙන බව සහතික කෙරෙන ආකාරයෙන් හැකිතාක් දුරට ඒ මැතිවරණ කොට්ඨාසය කලාප වලට බෙදිය හැක්කේ ය. එසේ වූව ද එම බෙදීම මන්ත්‍රීවරයන් දස දෙනෙකුට වැඩි එහෙත් විසි දෙනෙකුට අඩු සංඛ්‍යාවක් තෝරා පත් කිරිමට හිමිකම් ඇති මැතිවරණ කොට්ඨාසයක් කලාප දෙකකට නොවැඩි ගණනකට ද මන්ත්‍රීවරයන් විසි දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කිරීමට | <br><br><br><br><br><br><br><br><br>පරිච්ජින්න කරනු ලැබේ |

| | |
|---|---|
| හිමිකම් ඇති මැතිවරණ කොට්ඨාසයක් කලාප තුනකට නොවැඩි ගණනකට ද බෙදෙන පරිදි විය යුත්තේ ය. | |
| **දැනට පවත්නා ව්‍යවස්ථාව** | **යෝජිත ව්‍යවස්ථාව** |
| (4)මැතිවරණ කොට්ඨාසයක් කලාපවලට බෙදීමේ දි සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් හැකිතාක් දුරට එක් එක් කලාපය , ඡන්ද ප්‍රදේශ දෙකක හෝ වැඩි ගණනක එකතුවෙන් සංයුක්ත වන බවට වග බලා ගනු පිණිස, ඡන්ද හිමියන් ලියා පදිංචි කිරිම පිළිබඳව තත්කාලයෙහි බලපවත්නා නීතිය යටතේ ඒ මැතිවරණ කොට්ඨාසය බෙදනු ලැබ තිබෙන ඡන්ද ප්‍රදේශ , සැලකිල්ලට ගත යුත්තේ ය. | පරිච්ජින්න කරනු ලැබේ. |
| (5)96 වන ව්‍යවස්ථාවේ (5) වන සහ (6) වන අනුව්‍යවස්ථාවල විධිවිධාන , අවශ්‍ය වෙනස් කිරිම් සහිතව සීමා කොමිෂන් සභාවේ තීරණ වලට අදාළ විය යුත්තේය. | පරිච්ජින්න කරනු ලැබේ. |
| (6)මැතිවරණ කොට්ඨාස කලාපවලට බෙදීම පිළිබඳව කොමිෂන් සභාවේ තීරණ , මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වී මාස දෙකක් ඇතුළත සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය. | පරිච්ජින්න කරනු ලැබේ. |
| (7)සීමා නිර්ණය කොමිෂන් සභාවේ තීරණ ප්‍රකාශනයක් මගින් ප්‍රසිද්ධ කළ යුත්තේ ය. ඒ ප්‍රකාශනයේ නිශ්චය කොට දක්වා ඇති කලාප , ඒ ප්‍රකාශනයෙන් ඉක්බිතිව එළඹෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරිමේ මහ මැතිවරණයක දී ක්‍රියාත්මක විය යුත්තේ ය: තවද ඒ කලාප පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ හා සම්බන්ධව තත්කාලයේ බලපවත්නා කවර වූ හෝ නීතියක | |

| | |
|---|---|
| කාර්යය සඳහා ඒ මැතිවරණයට අනුකූලව මැතිවරණ කොට්ඨාසයේ කලාප වන්නේය. | |
| **දැනට පවත්නා ව්‍යවස්ථාව** | **යෝජිත ව්‍යවස්ථාව** |
| **1978 දෙවැනි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි සංශෝධනය**<br><br>ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පහළොස් වැනි සංශෝධනයෙන් පාර්ලිමේන්තු නියෝජනය සඳහා තීරණාත්මක සංඛ්‍යාව 1/8 (12.5 %) සිට 1/20 (5%) දක්වා අඩු කරන ලදි. මැතිවරණ කලාප යන්න ඉවත් කොට මැතිවරණ දිස්ත්‍රික්ක යන යෙදුම නැවත හඳුන්වා දෙන ලදි. මෙම සංශෝධන 1988 දෙසැම්බර් 17 දින සිට ක්‍රියාත්මක විය.<br>1. මෙම පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96 අ ( මින්මතුවට ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ ) මෙයින් පරිච්ජින්න කෙරේ. | පරිච්ජින්න කරනු ලැබේ.<br><br>නව මැතිවරණ ක්‍රමය මත සංශෝධනය කළ යුතුය.. |

## ඇමුණුම 5

2016 ඔක්තෝම්බර් 6

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,

අග්‍රාමාත්‍ය හා සභාපති ,

අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුව,

අග්‍රාමාත්‍ය කාර්යාලය,

58 , ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,

කොළඹ 7.

ගරු අග්‍රාමාත්‍යතුමනි,

### ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය පිළිබඳ මුලධර්ම හා පාදක ව්‍යුහය

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරිමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුව විසින් සැලකිල්ලට ගැනිම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සකස් කරන ලදි.**

වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ සහ 95 (1) ව්‍යවස්ථාවන් යටතේ 2015 නොවැම්බර් 13 දින සංස්ථාපනය කරන ලදි. කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සභාපති ආචාර්ය කේ. තවලිංගම් හා සාමාජික ආචාර්ය. අනිලා ඩයස් බණ්ඩාරනායක සහ මහචාර්ය එස් . එච්. හස්බුල්ලා යන අයගෙන් සමන්විත වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්වාධින කොමිෂන් සභා 9ක් ස්ථාපිත වන අතර ඒවායේ කාර්යයභාරයන් ඒ ඒ ව්‍යවස්ථාවන්ගෙන් පැහැදිලි කෙරේ. 95 වැනි හා 96 වැනි ව්‍යවස්ථාවන් සීමා නිර්ණය කොමිෂන් සභාවට අදාළ වන අතර එයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වී මාස තුනක් තුළ පිහිටුවිය යුතු වූ එම කොමිෂන් සභාව සඳහා නියමිත කාර්ය භාරයක් පැවරේ. වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව යථෝක්ත කාලසීමාව තුළ පත් කරන ලද්දක් නොවන නිසා 95 හා 96 ව්‍යවස්ථාවන් මෙයට කෙසේ අදාළ වේද යන්න පැහැදිලි නැත. අනෙකුත් බොහෝ කොමිෂන් සභාවලට මෙන් නොව මෙම කොමිෂන් සභාවට පැවරෙන බලය හා කාර්යයන් පැහැදිලි කිරිමක් සිදු වී නැත. මේ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හෝ නව ව්‍යවස්ථාවක් සම්මත විය යුතු වන බැවින් මෙම කාරණය 2015 නොවැම්බර් 23 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග සාකච්ඡා කරන ලදි. සීමා නිර්ණය කොමිෂන් සභාවක කාර්යයන් හා බලතල සම්බන්ධ යෝජනා රාජ්‍ය සේවා අනුකමිටුවේ ලේකම් වෙත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති වෙත 2016 ජූලි 7 දින ඉදිරිපත් කර ඇත. ( පිටපත අමුණා ඇත)

මේ අතර දැනට සකස් වෙමින් පවත්නා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සියලුම මට්ටම් වල පාර්ශවකරුවන් ගේ අදහස් ක්‍රමානුකූලව එක් රැස් කරමින් සකස් කෙරෙන බව අපට දැනගැනීමට තිබේ. එබැවින් මෙම කොමිෂන් සභාව පිහිටුවන ලද දින සිට අප විසින් පවත්වන ලද සාකච්ඡා වලින් සීමා නිර්ණය පිළිබඳව උද්ගත වූ කරුණු අතරින් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් තිරිමේ දී ප්‍රයෝජනවත් විය හැකියයි අප සලකන වර්තමාන දේශපාලන ආර්ථික හා සමාජමය කරුණු හා ඒ පිළිබඳ අපේ අදහස් ඔබ මෙහෙයුම් කමිටුවේ සැලකිල්ලට භාජනය කළ හැකිවන පරිදි මේ සමග ඉදිරිපත් කරනු කැමැත්තෙමු. ඇමුණා ඇති සටහන ඔබවෙත ඉදිරිපත් කරනුයේ ඒ සඳහාය

මෙම කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට ඔබ හා මෙහෙයුම් කමිටුවේ ඔබ නම් කරන අනෙකුත් සාමාජිකයන් ඔබට පහසු අවස්ථාවක හමුවිමට අපට අවස්ථාව සලස්වා දෙනුයේ නම් මැනවි.

මීට

විශ්වාසී

කේ . තවලිංගම්

සභාපති සීමා නිර්ණය කොමිෂන් සභාව

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා , අග්‍රාමාත්‍ය හා සභාපති - ශ්‍රී ලංකා අණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව වෙත ,

ආචාර්ය කේ. තවලිංගම් , සභාපති , සීමා නිර්ණය කොමිෂන් සභාව වෙතින්

2016 ඔක්තෝබර් 4

**ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය සඳහා වූ මූලධර්ම හා පාදක ව්‍යුහය**

නව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේදී සැලකිල්ලට ගැනීම සඳහා 2015 වර්ෂයේදී පිහිටුවන ලද සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සකස් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ල

**1.** **හැඳින්වීම**

ශ්‍රී ලංකාව වැදගත් මංසන්ධියකට පැමිණ තිබේ. දැනට සකස් වෙමින් පවත්නා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාව සාමය , ස්ථාවරත්වය හා තිරසාර සංවර්ධනය කරා යොමු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව තුළ ඇති කෙරෙන ධනාත්මක වෙනස මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් වඩා වේගවත් කෙරෙන බව අලුතින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් වන අපගේ විශ්වාසයයි. එය යතාර්ථයක් බවට පත් කර ගැනීමට පරිශ්‍රමයක් දැරිය යුතු බව අපි පිළිගනිමු. සීමා නිර්ණය පිළිබඳ සියලු කාරණා මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නිරාකරණය වනු ඇතැයි අපි සිතමු.

අප දන්නා තරමට දැනට සකස් වෙමින් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ සියලුම මට්ටම් වල පාර්ශවකරුවන්ගේ අදහස් ක්‍රමානුකූලව විමසා බලා පිළියෙල වන්නකි. ගත වූ නොවැම්බර් මස අප පත් කරන ලද දිනයේ සිට සීමා නිර්ණය පිළිබඳ මූලධර්මයන් හා වැදගත් කාරණා සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා වලින් එළි දැක්වුණු අදහස් මෙලෙස බෙදා හදා ගැනීමට අපි කැමැත්තෙමු. එම අදහස් යෝජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඇතුලත් කිරීම සුදුසුයයි අපි සිතමු. මෙම කෙටි සටහන ඔබ වෙත ඉදිරිපත් කරනු යේ ඒ සඳහාය. මෙම ලියවිල්ල සකස් කරන ලද්දේ පූර්වගාමී සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තා ද , අදාළ කාරණා පිළිබඳව පළ වී ඇති ලියකියවිලි ද වෙනත් රටවලින් ලද හැකි අත්දැකීම් ද අප ලබා ගෙන ඇති දැනුම හා පරිචයන් ද ආශ්‍රය කොට ගෙනය.

**2.** **වර්තමාන තත්වය හා අනාගත දැක්ම**

1972 ජනරජ ව්‍යවස්ථාව දක්වා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලින් සීමා නිර්ණය කොමිෂන් සභාවට ජනගහනය හා භූමි ප්‍රමාණය පදනම් කරගත් පැහැදිලි කාර්ය භාරයක් පැවරී තිබිණ. ඉන් පසුව හඳුන්වා දෙන ලද 1978 ව්‍යවස්ථාවෙහි හා ඊට එකතු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වලින් සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කිරීම හා එවැන්නක් සඳහා වූ කාර්ය භාරයක් ගැන පැහැදිලි සඳහනක් දක්නට නොලැබිණ.

තවද පළාත් පාලන මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය  වෙනත් නීතියක් යටතේ සීමා නිර්ණය කමිටුවකට පැවරි තිබුණ අතර එයින් සීමා නිර්ණය පිළිබඳ විෂයත් , ඒ සඳහා වූ හේතු සාධකත්, කාර්ය භාරයන් පිළිබඳ වගකීමත්, සම්බන්ධව ව්‍යාකුල භාවයක් නිර්මාණය විය. මේ නිසා ජනගහණ රටාව , භූමි ප්‍රමාණය හා මැතිවරණ දිස්ත්‍රික්ක පිළිබඳව වෙනත් සාධකයන් හා බැඳුණු සීමා නිර්ණය කිරිම සම්බන්ධ තර්කානුකුල පදනමක් නැවත බිහි කිරිම සඳහා මුලධර්ම පද්ධතියක් හා පාදක ව්‍යුහයක් අවශ්‍යව තිබේ. මෙහිදී ජාතික , පළාත් සභා හා පළාත් පාලන යන සෑම මට්ටමක් සඳහාම වූ මුලධර්ම හා පාදක ව්‍යුහයක් බිහි කිරිම ප්‍රඥාගෝචර වේ.

ඒ අතරම ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාස (ජාතික , පළාත් සභා , පළාත් පාලන ) සීමාවන් ද පරිපාලනමය ( දිස්ත්‍රික් , ප්‍රදේශිය ලේකම් කොට්ඨාස , ග්‍රාම නිලධාරි කොට්ඨාස ) සීමාවන් ද රාජ්‍ය සේවාවන්ට ( සෞඛ්‍ය , අධ්‍යාපන හා ආරක්ෂා සේවාවන්) සම්බන්ධ සීමාවන් ද අතර භූගෝලිය සාම්‍යයක් හෝ සුගම බවක් නොමැති අතර එවැන්නක් ඇති කිරිමට ප්‍රමුඛතාව දීමක් ද සිදු නොවේ. මේ නිසා සම්පත් බෙදී යාම ප්‍රමාණවත් ලෙස සිදු නොවන අතර රට තුළ මැතිවරණ නියෝජනය , පරිපාලනය හා සේවා සැපයීම සම්බන්ධයෙන් අකාර්යක්ෂමතාවක් පවති. ජාතික දේහයේ මෙම හිඩැස් පිරවිම සඳහා අගනා අවස්ථාවක් දැන් උදාවි තිබේ.

**3. දිර්ඝ කාලින අරමුණු පදනම් කර ගත් මුලධර්ම :**

නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ කිසියම් අපේක්ෂකයකු වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරිමේ අරමුණ විය යුත්තේ පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නියෝජනය ලබා දිමය.

3.1 ජනතාවගේ ආරක්ෂාව - ජනතා සුබ සිද්ධිය ( භෞතික , අධ්‍යාත්මික හා සංවේදි කාරණා ) වැඩි දියුණු කිරිම

- භෞතික - ආහාර , ඇඳුම් පැලඳුම් , නිවාස , පොදු පහසුකම් , සනිපාරක්ෂාව , ප්‍රවාහන හා සන්නිවේදනය සඳහා ප්‍රවේශය
- අධ්‍යාත්මික - අධ්‍යාපන , රැකියා නියුක්තිය , සංස්කෘතිය පිළිබඳ ප්‍රවේශය
- සංවේදීය - සිතිමේ හා කථා කිරිමේ නිදහස . පුද්ගලික ආරක්ෂාව , පොදු ආරක්ෂාව ආගමික සිද්ධස්ථාන වලට ප්‍රවේශ විම , වින්දනය හා ක්‍රිඩා

3.2 භූමියේ ආරක්ෂාව - එහි සම්පත් සුරක්ෂිත කිරිම ( ඉඩම් , ජලය , වාතය )

- ඉඩම් - වෘක්ෂලතා හා ජීවින් , ඛණිජ ද්‍රව්‍ය හා භූමි සම්පත් සුරක්ෂිත කිරිම.
- ජලය - මිරිදිය හා සාගර සම්පත් සුරක්ෂිත කිරිම
- වාතය - වායුගෝලය , වර්ෂාපතනය හා ඕසෝන් ස්තරය සුරක්ෂිත කිරිම

3.3 ජන වර්ගය , ආගම , කුලය , පුම්තිරිභාවය , සමාජ තත්වය , දේශපාලන මතවාද හෝ වෙනත් එවැනි විෂමතාවන් නොසලකා ජනතා සුබ සිද්ධිය ළගා කර ගැනිමට පුරවැසියන්ට එක සමාන අවස්ථා සැලසිම.

පුරවැසියනට තම නියෝජිතයන් තෝරා පත් කර ගැනිම සඳහා අවශ්‍ය මැතිවරණ දිස්ත්‍රික්ක නිර්මාණය කිරිමේ පාදක ව්‍යුහය 1. පුරවැසියාගේ සුබ සිද්ධිය , 2.තිරසර පරිසරය 3. සමාන ප්‍රවේශය යන මුල ධර්ම තුන මත පදනම් විය යුතුය.

කෙටිකාලීන කරුණු විමසා බැලිම: අද රටේ පවත්නා දේශපාලන හා සමාජ පසුබිම් ගැන අපි දනිමු. එසේම අතීතයේ පැවති සිතුම් පැතුම් වල වෙනසක් කිරිමට සිදුවන්නේ නම් එය සංවේදී ලෙස පියවරින් පියවර සිදු කළ යුතුය. නිදහස ලත් දිනයේ පටන් යම් යම් කාලසීමාවන් වල විශේෂයෙන් ගතවූ වසර තිහ තුල සිදුවූ සිවිල් අරගල නිසා අත් විදින්නට සිදුවූ අමිහිරි සිද්ධින් ගැන සලකා බලන විට වාර්ගික හා ආගමික සුලු ජන කොට්ඨාස වලට තමන්ගේ ආසන්නයේම ඇති බියෙන් හා අනාරක්ෂිත භාවයෙන් මිදිමට නොහැකි බව පෙනි යයි. ඉහතින් දක්වන ලද දිර්ඝ කාලීන වූද ස්ථාවර වූද මුලධර්මයන් සීමා නිර්ණය සඳහා සාධාරණ ලෙස යොදා ගතහොත් මෙම කෙටි කාලින ගැටලුවලට ද විසඳුම් එමගින් සොයා ගත හැකිය. ශ්‍රී ලාංකික අනන්‍යතාව ගොඩනැගිය හැකි හොඳම අවස්ථාව වන්නේ මෙයයි.

**4. මැනවින් මුලධර්ම පදනම් කරගත් සීමා නිර්ණය පිළිබඳ පාදක ව්‍යුහය**

4.1 සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි

- පවත්නා පරිපාලනමය සීමා , සේවා සැපයීම් සීමා හා මැතිවරණ කොට්ඨාස සීමා
- ජන සංයුතියේ ප්‍රමාණය , ජන ඝනත්වය හා ගෘහ ඝනත්වය
- භූමි ප්‍රදේශය , භූගෝලිය ලක්ෂණ හා භූමිය සම්බන්ධයෙන් පවත්නා විශේෂ ලක්ෂණ
- නිවාස , පොදු පහසුකම් , සනිපාරක්ෂාව සහ ප්‍රවාහන හා සන්නිවේදන මාර්ග සඳහා ප්‍රවේශය
- අධ්‍යාපන හා රැකියා නියුක්තිය
- පොලිසියට හා ආගමික සිද්ධස්ථාන වලටත් සංස්කෘතික කටයුතු හා ක්‍රිඩා කටයුතු වලටත් ප්‍රවේශ විමේ හැකියාව
- අද පවත්නා හා අනාගතයේ බිහිවන සම්පත් ප්‍රමාණය හා අනාගත ආර්ථික දියුණුව පිළිබඳ අපේක්ෂා

4.2 සීමා නිර්ණය සම්බන්ධයෙන් 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ පවත්නා අඩුපාඩු:

වාර්ගික සාධකය සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කළ යුතු බව විසි වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙහි සඳහන් විය. මෙම කාරණය පළාත් පාලන මැතිවරණ සම්බන්ධයෙන් වූ 2012 අංක 22 දරණ පනතෙහිද දක්වා තිබිණ. එය එසේ අවධාරණය කර ඇත්තේ එවකට රටේ පැවති තත්වය පදනම් කරගෙන විය හැකිය.

උදාහරණ : 2012 අංක 12 දරණ පළාත් පාලන මැතිවරණ ( සංශෝධන ) පනතේ 3 ආ 2 (අ) වගන්තිය හා 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 96 අ 2 (අ)

2 .............. පහත දැක්වෙන කරුණු ගැන සැලකිලිමත් වනු ඇත ...............

(අ) අදාළ ප්‍රදේශයේ ජනගහනයේ වාර්ගික සංයුතියේ අනුපාතය සහ එම අනුපාතයට සරිලන නියෝජනයක් ලබාදිම සඳහා ..................

යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි වාර්ගික සංයුතිය පමණක් සැලකිල්ලට ගත හොත් එයින් බෙදීමක් ඇතිවනවා පමණක් නොව එම උප ජනගහනය තුළ ඇති ආගමික ලක්ෂණ, කුල සාධකය , ප්‍රමිතිරි භාවය , වයස , සමාජ තත්වය , දේශපාලන බැඳිම වැනි අනෙකුත් සමාජ විෂමතාවන් නොසලකා හැරිමක් ද සිදුවේ. මෙම කාරණය නැවත සැලකිල්ලට භාජනය කොට ගැඹුරින් සාකච්ඡා කර විවෘත වූ විසඳුමක් සොයා බැලිය යුතුය. එමගින් බෙදා වෙන් කිරිමකට නොව සැම දෙනාම එකතු කර ගන්නා විසඳුමකට යා යුතුය. එය " ශ්‍රී ලාංකික" වූ අනන්‍යතාවයක් ඇති සංස්කෘතියක් බිහි කිරිමට ද "ඔවුන්ට" එරෙහිව "අපි" යන සංකල්පයට වඩා "අපි" යන හැඟිම පැලපදියම් කිරිමට ද සාධක වනු ඇත. වගන්ති (ආ) , (ඇ) හා (ඈ) යන උප වගන්ති වලට සමානවන ඉහත 4.1 ඡේදයේ සඳහන් සාධක මගින් හා 3 ආ (2) හා 96 අ (2) වගන්ති වලින් බෙදීමක් සිදු නොවන බව මෙහිලා සැලකිය යුතුය.

4.3 අනෙකුත් ප්‍රායෝගික කාරණා

ඉහත 2 ඡේදයෙහි සඳහන් වූ පරිදි අද පවත්නා (අ) මැතිවරණ කොට්ඨාස සීමා ( ජාතික , පළාත් සභා හා පළාත් පාලන ) (ආ) පරිපාලන සීමා ( දිස්ත්‍රික් , ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස , ග්‍රාම නිලධාරි කොට්ඨාස) හා (ඇ) සේවා සැපයිම් සීමා (අධ්‍යාපන , සෞඛ්‍ය , අධිකරණ , පොලිසිය , කෘෂිකර්ම ව්‍යාප්තිය ආදිය) එකිනෙක ගැලපෙන්නේ හෝ සමාන වන්නේ නැත. කෙටියෙන් කිවහොත් මේ සියලුම සීමා මායිම් යොදාගෙන අත්තේ මහජනතාවට ඉහත 4 වගන්තියේ අන්තර්ගත අරමුණු (අ) තෝරාපත් කරගන්නා නියෝජනය (ආ) විමධ්‍ය පරිපාලනය (ඇ) විමධ්‍ය ගත සේවා සැපයිම් යන කරුණු ඉටු කිරිම සඳහාය. මේ නිසා සීමා නිර්ණය නමැති විෂයේදී මේ සියලු සීමාවන් සඳහා එකම මූලධර්ම පද්ධතියක් හා පාදක ව්‍යුහයක් අනුගමනය කළ යුතුය.

4.4 පවත්නා යථා තත්වය - වර්තමාන ජනගහණය හා භූමි රටාව

පහත 1 වගුවෙහි දැක්වෙන පරිදි ජනගහණය හා භූමි ලක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ පළාත් නවය පැහැදිලිවම පහත සඳහන් උප කාණ්ඩ තුනකට බෙදේ.

රටේ අගනුවර ද පරිපාලන කේන්ද්‍රීය ස්ථානයන් ද, කර්මාන්ත , වාණිජ හා ව්‍යාපාරික ස්ථානයන් ද ප්‍රධාන ගුවන් තොටුපල හා වරාය ද පිහිටා ඇති බස්නාහිර පළාත මිලියන 5කට අධික ජනගහණයක් ඇති එකම පළාත වේ. අඩුම බිම් ප්‍රමාණය වන වර්ග කිලෝමීටර 4000 ක් ඊට අයත් වන අතර වර්ග කිලෝමීටරයකට 310 ක් වන රටේ සාමාන්‍ය ජනගහණ ඝනත්වය මෙන් 5 ගුණයක් එහි අන්තර්ගතය.

ආර්ථික කටයුතු පිළිබඳ කේන්ද්‍රස්ථානය වන මෙම පළාතට යාබදව ඇති මධ්‍යම , දකුණ , උතුරු මැද හා සබරගමුව යන පළාත් 4 දෙවැනි උප කාණ්ඩයට වැටේ. ඒවාහි ජනගහණය මිලියන 1.9

හා 2.6 අතර වේ. භූමි ප්‍රමාණයන් වර්ග කිලෝමීටර 4,900 සිට 8,000 අතර වේ. මේවාහි ජනගහණ සනත්වය සාමාන්‍ය ජනගහණ සනත්වයට ආසන්නය.

ආර්ථික කේන්ද්‍රීය පළාතට දුරින් ම පිහිටි පළාත් 4 වන නැගෙනහිර , උතුරු මැද , ඌව හා උතුර යන පළාත් භූමි ප්‍රමාණයෙන් විශාලය. එහෙත් මානව සම්පත් අතින් අඩුය. ජනගහණය මිලියන 1.0 සිට 1.6 අතර පවති. භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 8,500 සිට 10,500 දක්වා වේ. මේ නිසා ඒවා තුන්වැනි උප කාණ්ඩයට ඇතුළත් වන අතර ජනගහණ සනත්වය සාමාන්‍ය ජනගහන සනත්වයෙන් අඩකට ආසන්න වේ.

මෙම කාණ්ඩ රටාවෙහි වෙනසක් ඉදිරි වසර ගණනාව පුරා දක්නට නොලැබෙනු ඇත. එබැවින් මැතිවරණ දිස්ත්‍රික්කයක ජනගහණය හා භූමි ප්‍රමාණය අනුව මැතිවරණ නියෝජනය ලබා දෙන විට 3 ඡේදයේ සඳහන් මුලධර්ම තුනට අනුකුලව ඉහත 4.3 ඡේදයේ සඳහන් (අ) (ආ) (ඇ) යන සීමා නිර්ණය වර්ගයන්හි පවත්නා විශේෂ ලක්ෂණ සැලකිල්ලට ගත යුතුවේ. මෙම උපකාණ්ඩ තුන විශේෂ කොටස් තුනක් ලෙස ගත්විට සීමා නිර්ණයේදී වඩාත් අර්ථවත් මානයක් සකස් කළ හැකි වන අතර මැතිවරණ නියෝජනය වඩාත් තාර්කික ක්‍රමයකට උපයෝගී කර ගැනිමටද හැකිවනු ඇත. මෙම 3.3 හි දැක්වෙන මුලධර්මයෙහි අන්තර්ගත සුලු වාර්ගික ජන කොට්ඨාස වලට නිර්නියෝජණයක් හෝ අඩු නියෝජනයක් ලැබෙතැයි ඇතිවන සැකය හෝ බිය තුරන් කිරිමට ද එමගින් හැකිවනු ඇත.

වගුව **1.** වර්තමාන ජනගහණ හා භූමියේ ගුණාංග

| පළාත | කාණ්ඩය | ජනගහනය | ගෘහ සංඛ්‍යාව | භූමි ප්‍රමාණය (ව.කිමී) | ජනගහනය/ භූමි ප්‍රමාණය | ගෘහ සංඛ්‍යාව /භූමි ප්‍රමාණය/ | භූමි ප්‍රමාණය (වර්ග කිලෝමීටරයට) ජනගහනයේ අනුපාතය | භූමි ප්‍රමාණයට (වර්ග කිලෝමීටරයට) ගෘහ සංඛ්‍යාවේ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1 | 5,851,130 | 1,482,221 | 3,684 | 1,588 | 402 | 13.3 | 13.8 |
| මධ්‍යම | 2 | 2,571,557 | 658,911 | 5,674 | 453 | 116 | 3.8 | 4.0 |
| දකුණ | 2 | 2,477,285 | 636,406 | 5,544 | 447 | 115 | 3.7 | 3.9 |
| වයඹ | 2 | 2,380,861 | 646,145 | 7,888 | 302 | 82 | 2.5 | 2.8 |
| සබරගමුව | 2 | 1,928,655 | 506,642 | 4,968 | 388 | 102 | 3.2 | 3.5 |
| නැගෙනහිර | 3 | 1,555,510 | 397,083 | 9,996 | 156 | 40 | 1.3 | 1.4 |
| උතුරු මැද | 3 | 1,266,663 | 342,366 | 10,472 | 121 | 33 | 1.0 | 1.1 |
| ඌව | 3 | 1,266,463 | 335,037 | 8,500 | 149 | 39 | 1.2 | 1.3 |
| උතුර | 3 | 1,061,315 | 259,471 | 8,884 | 119 | 29 | 1.0 | 1.0 |
| එකතුව | | **20,359,439** | **5,264,282** | **65,610** | **310** | **80** | **2.6** | **2.7** |

| | |
|---|---|
| 1 කාණ්ඩය | ජනගහනය >මිලියන 5 , භූමි ප්‍රමාණය <4,000 ව.කි.මි : ජනගහනය/භූමිප්‍රමාණය>1,500, ගෘහ සංඛ්‍යාව/භූමි ප්‍රමාණය>400 |
| 2 කාණ්ඩය | මිලියන 1.9 < ජනගහනය< මිලියන 2.6, 4,900<භූමි ප්‍රමාණය<8,000; 300<ජනගහනය/භූමි ප්‍රමාණය <500 , 80<ගෘහ සංඛ්‍යාව/භූමි ප්‍රමාණය<120 |
| 3 කාණ්ඩය | මිලියන 1.0 <ජනගහනය< මිලියන 1.6, 8,500<භූමි ප්‍රමාණය<10,500; 100<ජනගහනය/භූමි ප්‍රමාණය<160, 25<ගෘහ සංඛ්‍යාව/භූමි ප්‍රමාණය<40 |

අප දක්වා ඇති පරිදි රට අනාගතයේදී වඩාත් ස්ථාවර හා සුරක්ෂිත අනාගතයක් වෙත ළගා කරවීමට නම් සීමා නිර්ණයේදී ඥානාන්විත ලෙස , බෙදීම් වලට ගොදුරු නොවන පදනමක් මත පිහිටා ක්‍රියා කළ යුතුය. මැතිවරණ සීමා නිර්ණයේදී පමණක් නොව දේශපාලන , පරිපාලන හා සේවා සැපයීම් සම්බන්ධයෙන් අවශ්‍ය වන්නාවු භූගෝලීය සීමා වෙන් කිරිමේදී ද මෙය උපයෝගි කොට ගත යුතුවේ.

## 5. නිර්දේශ

ඉහත දක්වන ලද කාරණා ඔස්සේ යමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පහත සඳහන් කරුණු අන්තර්ගත කිරීම කාලෝචිත වන බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

5.1 ඉහත 3 ඡේදයෙහි සඳහන් මූලධර්ම තුන,

5.2 පළාත් නවයෙ හි භූමි ප්‍රමාණය හා ජනගහණ ව්‍යාප්තිය සලකා බැලීමේදී ඉහත 1 වගුවෙහි දක්වා ඇති උප කාණ්ඩ තුන පිළිබඳ සංකල්පය උපයෝගී කර ගැනීම,

5.3 මැතිවරණ කොට්ඨාස , පරිපාලන ප්‍රදේශ හා සේවා සැපයීම් ප්‍රදේශ යනුවෙන් ඉහත 4.3 හි දක්වන ලද (අ) , (ආ) , (ඇ) භූගෝලීය සීමා වර්ග තුනට බෙදීම දක්වා සීමා නිර්ණ සංකල්පය ව්‍යාප්ත කිරීම හා

5.4 මෙම වගකීම හා කාර්ය භාරය ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා එය එකම ස්ථිර සීමා නිර්ණය කොමිෂන් සභාවකට පැවරීම

සීමා නිර්ණය පිළිබඳ මූලධර්ම හා පාදක ව්‍යුහය සම්බන්ධයෙන් ඔබ මෙහෙයුම් කමිටුව දරණ අදහස් හමුවේ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සීමා නිර්ණය සම්බන්ධ වූ ඉහත නිර්දේශයන් පිළිබඳව ඔබට පහසු අවස්ථාවක හැකි ඉක්මණින් ඔබ හා ඔබගේ මෙහෙයුම් කමිටුවේ ඔබ නම් කරන සාමාජිකයන් හමු වී සාකච්ඡා කිරීමට සීමා නිර්ණය කොමිෂන් සභා සභාපති හා සාමාජිකයන් කැමැත්තෙන් සිටින බව කාරුණාවෙන් දන්වමි.

ස්තූතියි.